(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 33 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **1999** ඔක්තෝබර් මස **07** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ඔක්තෝබර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **5. 75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වැනි දින.]

එල්. ඩී.–ඕ. 54/98.

## 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1999 අංක 33 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(කෙටි නාමය.)*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ ප්‍රධාන ප්‍රඥප්තිය හෝ එවැනි වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ හෝ සාදන ලද හෝ නියම කරන ලද හෝ බලය පවරන ලද යම් දැන්වීමක, ලිපියක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක "සමාජ ආරක්ෂණ මණ්ඩලය" යන යෙදුම දක්වා ඇති කවර හෝ අවස්ථාවක දී ඒ වෙනුවට "ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය. *(1996 අංක 17 දරන පනත සහ අනෙකුත් ලිඛිත නීති සාමාන්‍ය ලෙස සංශෝධනය කිරීම.)*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:– *(ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(2) අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂවරයන් අතුරින් එක් අධ්‍යක්ෂවරයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු අතර, වෙනත් අධ්‍යක්ෂවරයකු මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබිය හැකි ය."

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ : - *(ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

"(4) මෙම පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ කාර්ය වනුයේ ධීවර හා කෘෂිකාර්මික අංශවල සේවයේ නියුතු අය හැර, වෙනත් ස්වයං රැකියාවල නියුතු අය සඳහා (මෙහි මින් මතු "යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්‍රාම

වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හා පහත දැක්වෙන අරමුණු ඇතිව එම යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම වේ. : -

(අ) ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේ දී හෝ ඔවුන් යම් අශක්නුතාවකට පත් වූ විට එම කාලයේ දී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම;

(ආ) ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් මියගිය විට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම;

(ඇ) ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම;

(ඈ) ස්වයං රැකියාවල යෙදෙන ලෙස තරුණයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම;

(ඉ) සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම : සහ

(ඊ) සාමාන්‍යයෙන් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම."

ප්‍රධාන ප්‍රඥප්තියේ 5වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය එම වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(ඊඊ) මණ්ඩලයේ කර්තව්‍යයන්ට සමාන කර්තව්‍යයක් ඉටු කරන රාජ්‍ය ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම ;"

6 අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ, වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය. : -

6 අ (1) අමාත්‍යවරයාගේ මතය අනුව, සමාජ ආරක්ෂණය, සමාජ සුභ සාධනය, රක්ෂණය, ජීව ගණක තක්සේරුව, පරිපාලනය, මුදල් හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති හෝ හැකියාවන් පෙන්නුම් කර ඇති තැනැත්තන් අතරින් නව දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන ) කාර්මික උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. "කාර්මික උපදේශක කමිටුව.

(2) මණ්ඩලයේ සභාපතිවරයා කමිටුවේ සභාපතිවරයා ද විය යුතු ය.

(3) කමිටුවේ කර්තව්‍ය වනුයේ : -

(අ) යෝජනා ක්‍රමයේ පරිපාලනය හා කළමනාකරණයට අදාළව, මණ්ඩලය විසින් කමිටුව වෙත කලින් කල යොමු කරනු ලැබිය හැකි කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම ;

(ආ) යෝජනා ක්‍රමය පරිපාලනය කරනුයේ හෝ කළමනාකරණය කරනුයේ යම් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ද, එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ අදාළ යයි කමිටුව සලකන වෙනත් කරුණු පිළිබඳ මණ්ඩලයට උපදෙස් දීම : සහ

(ඇ) මණ්ඩලය විසින් රීති සෑදීම පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම,

(4.) අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික, මණ්ඩලයේ අරමුදලින් කමිටුවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : -

(1) එහි (1) වන උපවගන්තියේ " වයස අවුරුදු හැටට එළඹීමේ දී" යන වචන වෙනුවට "(1අ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වයස අවුරුදු හැටට එළඹීමේ දී " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් –

"(1අ) අවුරුදු 35 ට එළඹීමට පෙර දායක වීම ආරම්භ කළ වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයකු විසින් මානසික දුබලතාවකට පත් වී ඇතැයි සහතික කරනු ලැබූ දායකයකු, අවුරුදු 40 ට එළඹීමේ දී විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය. "

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "ඔහුගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයාට" යන වචන වෙනුවට "ඔහු විසින් මණ්ඩලයට භාර දෙනු ලැබූ නියමිත ආකෘති පත්‍රයේ නම් සඳහන් කරනු ලැබිය හැකි යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෙවනු ලැබිය යුතු හෝ, ඒ වෙනුවට ඔහුගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයාට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : -

(1) එම වගන්තියේ 2 වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් : -

"(ඇඇ) කවර හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ මහජන සංස්ථාවකින් මණ්ඩලයට පවරා දෙනු ලැබිය හැකි සියලුම මුදල් ;" සහ

(2) එම වගන්තියේ, 3 වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් –

" (4) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ සියයක් විය හැකි අතර, එම මුදල පාර්ලිමේන්තු විසර්ජන පනතින් හෝ පාර්ලිමේන්තුවේ සම්මතයකින් අනුමත කිරීමෙන් වරින් වර වැඩි කළ හැක. එම ප්‍රාග්ධන ප්‍රමාණය මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ උපදේශය හා අමාත්‍ය තීරණය මත වාරික වශයෙන් ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය හැකි අතර, එම මුළු ගණන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය යටතට මණ්ඩලය ඇතුළත් කිරීමෙන් පසු මණ්ඩලයේ ලාභය සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය . "

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යː - ප්‍රධාන ප්‍රඥප්තියට 28 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"විධානය දීමට අමාත්‍ය වරයාට හිමි බලය.

28 අ (1) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් පොදු විධාන දෙනු ලැබිය හැකි අතර, එබඳු සෑම විධානයක් ම බලාත්මක කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතුය.

(2) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ තොරතුරු සපයන මෙන් අමාත්‍යවරයා ලිඛිතව මණ්ඩලයට විධාන කළ හැකි අතර, එබඳු සෑම විධානයක් ම බලාත්මක කිරීම මණ්ඩලයේ යුතුකම විය යුතු ය."

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.